**ඒරාවූර් නගර සභාව - 2017**

**මඩකලපුව**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂ අවසානයේ කුලී (50-323) හිඟ ආදායම් රු. 3,506,505ක් සමාලෝචිත වර්ෂය සඳහා ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙනැවිත් නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මාර්ග ඉදිකිරීම්, කානු ඉදිකිරීම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු. 72,722,455ක් වැය කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) වාහන නැවතුම් පොළ ඉදිකිරීම සඳහා සභාව විසින් මිලදී ගනු ලැබූ රු. 51,900ක් වටිනා භාණ්ඩ ගොඩනැගිලි ගිණුමෙහි ගිණුම්ගත නොකර ලීබඩු ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණි.

(ඈ) දේශීය ණය සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂ අවසානයට රු.4,885,562ක් ගෙවිය යුතු හිඟ ලෙස දැක්විය යුතු වුවත් රු. 1,067,617ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|

| ---------- | ---------- | -------------- | ---------------------- |
|---|---|---|---|
| | | (රු.) | |
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 84,889,626 | ඉඩම් හිමිකම් ඔප්පු |
| (ii) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4,547,643 | |
| (iii) | මෝටර් වාහන | 2,936,615 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iv) | ලී බඩු හා සවිකිරීම් | 3,895,210 | |

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහ නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරිය 177(2) වගන්තිය | නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය ඊළඟ මාර්තු මාසයේ පළමු දිනයට පෙර රජයේ ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු වුවත් සභාවේ 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය මහජනතාවගේ දැනගැනීම පිණිස රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.381,544 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,931,239 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,549,695ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් පරිපාලනය**

-------------------------

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පැරණි කඩ කාමර සඳහා කුලී ලෙස පුද්ගලයින් 40 දෙනෙකුගෙන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා අයවිය යුතු හිඟ කුලී රු. 5,018,060ක් ව පැවතියද මේ දක්වා එය අයකරගෙන නොතිබුණි.

(ii) 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා බදුකුලී හිඟ ආදායම් රු.791,655ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

තිරසාර සංවර්ධන අරමුණු

---------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

1988 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිචඡේදය තුළ විවිධ අවශ්‍යතාවයන් සඳහා නගර සභා සෙවකයින්ට ලබාදී තිබූ අත්තිකාරම් රු. 2,983,996ක් නිරවුල් කර නොතිබූ අතර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

ගණකාධිකාරි තනතුරට අනුමත සේවක පුරප්පාඩුවක් පැවතුණද නගර සභාව ස්ථාපිත කරනු ලැබූ දින සිට මේ දක්වා එම තනතුරට කිසිදු නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

---------------------------------------------

4.1 පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු වාර්තා

------------------------------------------------------------------

ඒරාවූර් නගර සභාවේ 2017 වර්ෂයේ පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

**(අ)** අනුමත නොකළ කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම්

-----------------------------------------------------

(i) එක් ගොඩනැගිල්ලක 1m මතුපිට සඳහා වැය විය හැකි ප්‍රමිත රේටය රු.4,000ක් වුවත්, 1m ක මතුපිට සඳහා රු. 5,300ක් වැය වී තිබුණි. තවද, වර්ග මීටර් 1,683ක සම්පූර්ණ මතුපිට වපසරියක් අන්තර්ගත මෙම ගොඩනැගිල්ල සඳහා මේ දක්වා එකතුව රු. 89,465,726ක් වැය කර තිබුණත්, ඉදිකිරීම් කාර්යයන් සියල්ල සම්පූර්ණ කිරීම සඳහා තවත් කොන්ත්‍රාත්තුවක් ලබාදීමට සිදුවී තිබුණි.

(ii) යූඩීඒ, ආර්ඩීඒ සහ පරිසර අධිකාරියෙහි පූර්ව අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල අනුමත නොවූ ගොඩනැගිල්ලක් ලෙස සලකා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අදාළ අධිකාරිය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේදී සභාවට දඩ මුදල් ගෙවීමට සිදු විය හැකිය.

(iii) සුපරීක්ෂණ කාර්යයන්, මිල ගණන් තහවුරු කිරීම් සහතික කිරීම ආදිය සඳහා අධිකාරී බලය පැවරූ නිලධාරියා ලෙස ඉංජිනේරු සේවා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සිටියි. එසේ වුවත්, මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කරනු ලැබූ ඉංජිනේරුවරයෙකු නැගෙනහිර පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත මෙම අරමුණ වෙනුවෙන් සේවයේ යොදවා තිබුණි.

**(ආ) පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය සමඟ අනුමත නොවූ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම**

-----------------------------------------------------------------------------------------------

(i) කොන්ත්‍රාත්කරු විසින් සත්‍ය වශයෙන්ම ඝන මීටර් 400.42 ක පස් සපයා පුරවා තිබූ නමුත් සභාව විසින් ඝන මීටර් 988.80ක පස් සපයා පිරවීමට කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම් සිදු කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු.1,176,760 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු ඝන මීටර් 66.04 ඝනකම මතුපිටක් සාදා තිබුණත්, ගෙවීම් කිරීමේදී ඝන මීටර් 93.75 ක් ඝනකම මතුපිට සඳහා ගෙවීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් රු.387,980 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(iii) ආර්ඩීඒ, යූඩීඒ සහ පරිසර අධිකාරීයෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව මෙම ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණි.

**(ඇ) බදු හිමියෙකුගේ ඉඩමේ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම**

------------------------------------------------------------------

එකතුව රු.මිලියන 193 ක පිරිවැයකින් තට්ටු 03 ක වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය එකඟ වී තිබූ අතර, නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්වරයා මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම් සම්බන්ධයෙන් රු.99,939,468 ක කොන්ත්‍රාත් වටිනාකමට 2016 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. දේවස්ථාන 02 කින් වර්ෂ 33ක බදු පදනම මත එකතුව රු.මිලියන 22.28 ක් සඳහා සභාවට ලැබී තිබූ ඉඩමෙහි මෙම ගොඩනැගිලි සංකීර්ණය ඉදිකරමින් පැවැතුණි. කෙසේ වෙතත්, මෙම ගොඩනැගිලි ඉදිකෙරෙමින් පවතින ඉඩමේ අයිතිකරු ඒරාවූර් නගර සභාව බව දන්වමින් මෙම ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. මෙම වෙළඳ සංකීර්ණයේ මුළු පිරිවැය රු.මිලියන 193 ක් වශයෙන් පැවතුණද, අමාත්‍යාංශය අනුමත

කළ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීම වළක්වාලීමේ අරමුණෙන් රු.මිලියන 99.94 ක වටිනාකමට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

**(ඇ)** කොන්ත්‍රාත් **පදනමින් සේවකයින් බඳවා ගැනීම**

**-----------------------------------------------------**

අනුමත කාර්ය මණ්ඩලය තුළ නිලධාරීන් 25 දෙනෙකුගෙන් අතිරික්තයක් පැවතුණද, අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා නොගෙනද, මෙයට අදාල මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමේ අනුමැතිය ලබා නොගෙනද නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිදුකරන ලද ඉල්ලීම පදනම් කරගනිමින් 2015, 2016 සහ 2017 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 73 දෙනෙකු සභාව විසින් බඳවාගෙන තිබුණි.

තවද, සභාව විසින් පවත්වාගෙන යනු ලැබූ පුස්තකාල 03 ක් සඳහා (III ශ්‍රේණිය) අනුමත කළ සේවක සංඛ්‍යාව 05 ක් වුවද, එම පුස්තකාල සඳහා අනියම් සේවකයින් 17 දෙනෙකු ඇතුළත්ව සේවකයින් තිස්පස් දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

අනියම් පදනමින් පත් කර පුස්තකාලය සඳහා අනුයුක්ත කරනු ලැබූ සේවකයා එම පුස්තකාලයේ සේවය සඳහා වාර්තා නොකර 2015 වර්ෂයේ සිට වැටුප් ලබාගෙන තිබුණි.

**(ඉ)** රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් නොයැවීම

-----------------------------------------------------------------------

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායකත්ව මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතුය. කෙසේ වුවත්, 2015, 2016 සහ 2017 වර්ෂවලදී බඳවාගත් සේවකයින් 73දෙනෙකු සම්බන්ධයෙන් දායකත්ව මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යවා නොතිබුණි.

**(ඊ)** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

හිටපු ජනාධිපතිවරයාගේ ජන්ම දින සුභපැතුම් පණිවුඩය පුවත්පතක පළකිරීම සඳහා නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ඉල්ලීමට අනුව රු.22,000 ක් 2014 වර්ෂයේදී සභා අරමුදලින් වැය කර තිබුණි.

**(උ)** **ලැබිය යුතු ගිණුම්**

**---------------------**

2016 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟ බදු කුලී රු.3,213,941 ක් විය. ඉන් රු.1,135,760ක් වර්ෂ 07 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
| --- | --- |
| (අ) **ගිණුම් තැබීම** | **ලෙජර ගිණුම් දෛනිකව නිසි අයුරින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.** |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදි පසුගිය වර්ෂවල සත්‍ය වියදම් සැලකිල්ලට ගත යුතුය. |
| (ඈ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. |